# වැටුප් ප්‍රමාණ දර්ශක අංක

1952 = 100




ශ්‍රී ලංකා මහ බැංකුව.

මිළ ඉහළ යාම නිසාත්, සියයට 32ක් අන්තර් භාණ්ඩවල මිළ ඉහළ යාම නිසාත්, ඉතිරි සියයට 2 ආයෝජන භාණ්ඩයන්ගේ මිළ වැඩිවීම නිසාත් සිදුවී ඇති බවය. සාරාංශ වශයෙන් සළකන විට මිල ඉහළ යාම කැපී පෙනුණු වර්ෂයක් වූ 1980 න් පසුව 1981 දී වඩා යෝග්‍ය ඉල්ලුම් හැසිර වීම් ප්‍රතිපත්ති අනුගමනය කිරීමේ හේතුවෙන් මිළ මට්ටම කෙරහි වඩා සහනදයී බලපෑම් ඇතිවන ලකුණු පෙනෙන්නට තිබුනි.

## වැටුප්

විශේෂයෙන් රාජ්‍ය අංශයේ සේවකයන් සම්බන්ධයෙන් සලකා බලන කළ 1981 වර්ෂය රජයේ වැටුප් ප්‍රතිපත්තියේ සැලෙන වෙනසක් සිදුකළ වර්ෂයක් විය. වැටුප් සමාලෝචන කමිටුවෙන් නිර්දේශ කරන ලදුව රජය පිළිගත් නිර්දේශ මත මූලික වැටුප හා සියළු දීමනා ඒකාබද්ධ කිරීම, සේවකයන්ගේ වර්ග හා ශ්‍රේණි පහසුවෙන් පාලනය කළ හැකි ප්‍රමාණයකට අඩු කිරීම 1982 දී ක්‍රියාත්මක කෙරෙනු ඇත.

සියලුම රජයේ සේවකයින් සඳහා කොළඹ පාරිභෝගිකයින්ගේ මිළ දර්ශකය අනුව දීමනා වක් ගෙවීම 1981 වර්ෂයේ නොවැම්බර් මස සිට ක්‍රියාත්මක විය. මූර්ත වශයෙන් රජයේ සේවක යින්ගේ වැටුප් පහත වැටුණද, 1980 දී වාර්තා ගතවූ පහත වැටීම හා සසඳන කළ මෙම වර්ෂයේ අවසාන භාගයේ ක්‍රියාත්මක වූ දර්ශක ගත කිරීම මෙම පහත වැටීම සීමා කිරීමට උපකාරී විය. සංවිධානය වූ පෞද්ගලික අංශයේ ද මූර්ත වැටුප් පහත වැටුණි. කෙසේ වුවත්, වී වගාව සහ ගොඩනැගිලි ඉදිකිරීම් වැනි සංවිධානය නොවූ අංශවල වැටුප් මූර්ත වශයෙන් වැඩි විය. ආර්ථික යේ සංවිධානය වූ අංශයේ මූල්‍ය වැටුප් මැණීම රජයේ සේවකයන්ගේ හා වේතන මණ්ඩලවලින් ආවරණය වන සේවකයන්ගේ අවම වැටුප් ප්‍රමාණ දර්ශක මගින් කරනු ලැබේ. 1981 වර්ෂ යේදී රජයේ සේවකයින්ගේ අවම වැටුප් 1980 වර්ෂයට වඩා වැඩි වේගයකින් වර්ධනය විය. කාර්මික සහ ලිපිකාර සේවකයින්ගේ අවම වැටුප් ප්‍රමාණ දර්ශකය පසුගිය වර්ෂයේ සිදුවූ සියයට 10 වර්ධනය හා සසඳන කළ 1981 වර්ෂයේදී සියයට 13 කින් වර්ධනය විය. සුළු සේවකයින් හා පාසැල් ගුරුවරුන්ගේ අවම වැටුප් වැඩිවීම 1981 දී පිළිවෙලින් සියයට 16 ක් හා සියයට 12 ක් වූ අතර, එය 1980 වර්ෂයේදී පිළිවෙලින් සියයට 12 ක් සහ සියයට 9 ක් විය. අවම වැටුප් ප්‍රමාණයන්හි මෙම වැඩිවීම් රජයේ සේවකයින්ගේ වැටුප් 1981 නොවැම්බර් වලදී ජීවන වියදම් දර්ශකයට සම්බන්ධ කිරීමේ ප්‍රතිඵලයකි.

1980 වර්ෂයේදී සියයට 12 කින් සිදුවූ පහත වැටීම හා සසඳන කළ 1981 වර්ෂයේදී රජයේ සේවකයින්ගේ මූර්ත වැටුප්[1] සියයට 3 කින් පහත වැටුණි. කාර්මික හා ලිපිකාර සේවක යින්ගේ මූර්ත වැටුප් 1980 වර්ෂයේ සිදුවූ සියයට 13 ක අඩුවීම හා සසඳන කළ 1981 වර්ෂයේදී සියයට 5 කින් අඩුවිය. සුළු සේවකයින් හා පාසැල් ගුරුවරුන්ගේ මූර්ත වැටුප් 1980 වර්ෂයේ දී පිළිවෙලින් සියයට 12 කින් හා සියයට 14 කින් අඩුවූ අතර, 1981 දී එය අඩුවූයේ පිළිවෙලින් සියයට 2 කින් හා සියයට 6 කිනි.

සංවිධානය වූ පෞද්ගලික අංශයේ තේ, රබර් හා පොල් වගා අංශයන්හි සේවකයින්ගේ අවම වැටුප් 1981 වර්ෂයේදී සියයට 0.2 කින් යන්තමින් පහත වැටුනි. පසුගිය වර්ෂයේ සිදුවූ සියයට 22 ක වර්ධනය හා බලන කළ කාර්මික හා වාණිජ සේවකයින්ගේ අවම වැටුප් සියයට 13 ක අඩු වේගයකින් වර්ධනය විය. සංවිධානය වූ කෘෂිකාර්මික, කාර්මික හා වාණිජ අංශවල වැටුප් ප්‍රමාණයන් ඒකාබද්ධ කලවිට, අවම වැටුප් ප්‍රමාණ දර්ශකය පසුගිය වර්ෂයේ සිදුවූ සියයට 25 ක වර්ධනය හා සැසඳීමේදී සියයට 1 ක සුළු වැඩිවීමක් පෙන්නුම් කරයි.

1980 වර්ෂයේදී සියයට 0.2 ක සුළු අඩුවීමක් පෙන්නුම් කළ කෘෂිකාර්මික කම්කරු-වන්ගේ මූර්ත වැටුප් 1981 දී තවදුරටත් සියයට 16 කින් පහත වැටුණි. එසේම කාර්මික හා වාණිජ සේවකයින්ගේ මූර්ත වැටුප් පසුගිය වර්ෂයේදී සියයට 3 ක අඩුවීම හා සසඳන විට මෙම වසරේදී සියයට 5 කින් අඩු විය.

සංවිධානය වූ අංශ හා සසඳන විට වී වගාව හා ගොඩනැගිලි ඉදිකිරීම් වැනි සංවිධානය නොවූ අංශවල දිවයින පුරා දෛනික වැටුප් ප්‍රමාණයන් වඩා ඉහළ වර්ධනයක් පෙන්නුම් කරයි. 1980 වර්ෂයේදී වී ගොවිතැන සඳහා වූ දෛනික වැටුප රුපියල් 20 ක් වූ අතර, එය 1981 දී රුපියල් 25 ක් විය. මෙය සියයට 25 ක වර්ධනයකි. එසේම 1981 ඉදිකිරීම් අංශයේ පෙදරේරු හා වඩුවන් සඳහා දෛනික වැටුප් රුපියල් 45 ක් හා රුපියල් 46 ක් විය. මෙය 1980 වර්ෂයේදී වාර්තාවූ රුපියල් 37 ක් හා රුපියල් 36 ක් සමග සසඳන විට මෙම කාර්යයන් දෙකෙහි සේවකයන් සඳහා පිළිවෙලින් සියයට 21 ක හා සියයට 28 ක වැටුප් වර්ධනයක් පෙන්නුම් කරයි.

වී වගාව හා ඉදිකිරීම් අංශවල දෛනික වැටුප් කොළඹ පාරිභෝගිකයින්ගේ මිළ දර්ශකයෙන් අවධමනය කළවිට පිළිවෙලින් සියයට 6 ක සහ සියයට 8 ක මූර්ත වැඩිවීමක් පෙන්නුම් කරයි.

1. අවම වැටුප් කොළඹ පාරිභෝගිකයින්ගේ මිළ දර්ශකයෙන් අවධමනය කිරීම මගින් මූර්ත වැටුප් ගණනය කරනු ලැබේ.